# වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය

## ඉන්දියානු රජය මගින් අරමුදල් සපයනු ලබන වතු නිවාස වැඩසටහන

ඉන්දියානු රජය විසින්, ලයින් කාමරවල හා තාවකාලික තාවකාලික නවාතැන් තුළ ජීවත්වන වතුකරයේ ජනතාව සඳහා නිවාස 14,000 ක් ඉදිකිරීම සඳහා ප්‍රදානයක් ලබා දී ඇත. අදාළ වැඩසටහන, වසර **අනාගත තුළ,** වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය යටතේ, වතු කලාප හයක (එනම් බදුල්ල, නුවරඑළිය, හැටන්, මහනුවර, රත්නපුර, කෑගල්ල හා ගාල්ල) ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඒ අනුව අමාත්‍යාංශය විසින් ඒ සඳහා උපදේශක ඉංජිනේරුවරයකු, ව්‍යාපෘති ඉංජිනේරුවරයකු හා ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරීන් **හත් දෙනෙකු** බඳවා ගැනීමට තීරණය කොට ඇත.

## 1. උපදේශක ඉංජිනේරු - තනතුරු 01 (PS 3 තලය)

පහත 1, 2 හෝ 3 සඳහන් පරිදි අදාළ අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් **සමග** වසර 10 ක පශ්චාත් සුදුසුකම් කළමනාකරණ තලයේ පළපුරුද්ද තිබිය යුතු අතර, ඉන් වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ විය යුතුය.

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සහ පශ්චාත් උපාධියක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය **සමග** අවම වශයෙන් වසර 08 ක සුදුසුකම් ලැබීමෙන් පසු කළමනාකරණ තලයේ පළපුරුද්ද.

3. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I පංතිය නිලධාරියෙකු වීම **හෝ** අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක් **සමග** I පංතිය තනතුරක අවම වශයෙන් වසර 07 ක පළපුරුද්ද.

තෝරා ගැනීම, 2007 අගෝස්තු, උපදේශකයන් තෝරා ගැනීමේ හා සේවයේ යෙදවීමේ ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව සිදුකෙරේ.

## 2. ව්‍යාපෘති ඉංජිනේරු - තනතුරු 01 (PS 4 තලය)

පහල 1 හෝ 2 හි සඳහන් පරිදි අදාළ අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් **හෝ** අදාළ ක්ෂේත්‍රයේ, පිළිගත් වෘත්තීය ආයතනයක අන්තර්මධ්‍ය විභාගය සමත්වීම **සහ** සුදුසුකම් ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 07ක පළපුරුද්ද

2. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III/II පංතියක නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක් **සමග** III/II පංතිය තනතුරක අවම වශයෙන් වසර 07ක පළපුරුද්ද

මෙම තනතුරු දෙකම සඳහා වතු අංශයේ සංවර්ධන කාර්යවල පළපුරුද්ද සමග විදේශ අරමුදල් යෙදවූ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල පළපුරුද්ද සතුවීම සඳහා ප්‍රමුඛතාව හිමිවේ.

**රාජකාරි ස්ථානය :** අමාත්‍යාංශ කාර්යාලය, කොළඹ 03 - අදාළ කලාප වෙත නිතර සංචාරය කිරීමට සිදුවනු ඇත.

## 3. ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරී - තනතුරු 07 (PS-5 තලය)

පහල 1 හෝ 2 හෝ 3 හි සඳහන් පරිදි අදාළ අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් **හෝ** තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් හත තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සමග** අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 04ක පළපුරුද්ද

2. තාක්ෂණ ක්ෂේත්‍රයේ තනතුරකට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් 6 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සහ** අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09 ක පළපුරුද්ද තිබිය යුතුය.

3. තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් 5 තලයට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම **සහ** අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 14 ක පළපුරුද්ද.

**රාජකාරි ස්ථානය :** වතු ප්‍රාදේශීය කාර්යාල/ අමාත්‍යාංශ කාර්යාලය

## පොදු කොන්දේසි :

01. අයදුම්කරු වයස අවුරුදු 65 ට අඩු විය යුතුය.

02. තෝරාගත් කාර්ය මණ්ඩලයේ වැටුප්, 01/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව සිදු කෙරේ.

03. මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාවද ගෙවනු ලැබේ.

04. අයදුම්කරු විසින්, රජයේ සේවක අර්ථසාධක අරමුදලට තම මාසික වැටුපෙන් 8% ක දායකත්වයක් ලබාදිය යුතු අතර, සේවායා විසින් ඒ සඳහා 12% ක දායකත්වයක් ලබාදේ.

05. සේවා කොන්දේසි - මූලිකව, මෙම තනතුරට පත්කිරීම එක් වසරක් සඳහා කොන්ත්‍රාත් පදනමින් සිදු කෙරේ. අයදුම්කරුගේ සතුටුදායක කාර්ය සාධනය හා අමාත්‍යාංශයේ අවශ්‍යතාවය මත දීර්ඝ කිරීම සිදුකළ හැක.

06. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මගින් යොමු කළ යුතුවේ.

උනන්දුවක් දක්වන අයවලුන් තම සම්පූර්ණ ජීවදත්ත සහිත අයදුම්පත්, අධ්‍යාපනික හා පළපුරුද්ද සම්බන්ධ සහතිකවල පිටපත් සමග, ලියාපදිංචි තැපෑලෙන්, **ලේකම්, වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය, අංක 45, ශාන්ත මයිකල් පාර, කොළඹ 03** යන ලිපිනයට, **2021-01-15** දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ **වම් ඉහළ කෙළවරේ** අයදුම්කරුනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**ඩී.පී.පී. කුමාරසිරි,**

**ලේකම්,**

**වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය.**